# වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා කජු සංස්ථාව

# පුරප්පාඩු

## ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පහත සඳහන් තනතුරේ පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

## 01. සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි හා පිරිසැකසුම්) (MM 1-1) - තනතුරු 01

- **බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :- (පහත 1 හෝ 2)**

1. අලෙවිකරණය, ආහාර තාක්ෂණය විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම හා උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබාතිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

- **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :- (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කනිෂ්ඨ කළමනාකාර"(JM) සේවා ගණයෙහි II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සැ.යු :** අභ්‍යන්තර අයදුම්කරුවන් විසින් තම අයදුම්පත් යොමු කිරීමේදී තම අංශ ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව ඉදිරිපත් කළ යුතුය.

**වයස** : අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප් පරිමාණය** : රු.53,175/= -1,375 X 10 -1,910 X 15 - රු.95,575/=

❖ **ඉහතින් සඳහන් කර ඇති සුදුසුකම්වලට අමතරව සෑම අයදුම්කරුවෙක්ම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

උක්ත තනතුරු සඳහා ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත් අදාළ සහතිකවල ඡායා පිටපත් ද සමඟ පහත සඳහන් ලිපිනයට 2025.03.26 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. ඔබ විසින් ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

**සභාපති, ශ්‍රී ලංකා කජු සංස්ථාව,**
**නො.1334, පරණ කෝට්ටේ පාර,**
**රාජගිරිය.**